# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/11 - 2016 ජනවාරි මස 06 වැනි බදාදා - 2016.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ලියාපදිංචි අංක GA 2232 සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව මෙම නියමය මගින්, මෙහි උපලේඛනයේ II වැනි තීරයේ වූ අනුරූප සටහන්වල කෙටි යෙදුම්වල නිශ්චිතව දක්වා ඇත්තාවූද එහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන්, එහි උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස එම ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි යන ආයතනය පිළිගෙන සිටිමි.

### උපලේඛනය

| *I වැනි තීරය*<br>*උපාධි* | *II වැනි තීරය*<br>*උපාධි සඳහා කෙටි යෙදුම්* |
|---|---|
| ශාස්ත්‍රවේදී උපාධිය | බී ඒ (සාමාන්‍ය) |
| පාලි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | බී ඒ (විශේෂ) පාලි |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | බී එස් සී අයි ටී |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජනවාරි මස 04 වැනි දින.
කොළඹ දී ය.

01 - 710

1A - PG 2758 — 506 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*